# කුසුමා ගුණවර්ධන සමරු මුද්දරයක්




දිවංගත පාර්ලිමේන්තු මන්ත්‍රීනි කුසුමා ගුණවර්ධන මැතිණියගේ ජන්ම සංවත්සරය නිමිත්තෙන් සමරු මුද්දරයක් නිකුත් කිරීමේ උත්සවය නොබෝදා ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති ලේකම් කාර්යාලීය ශ්‍රවණාගාරයේදී පැවැත්විණ. එහි ආරාධිත දේශණය පවත්වන ලද්දේ ප්‍රවීණ මාධ්‍යවේදී ඇස්. පියසේන මහතාය.

පියසේන මහතා 1940 රාමගාන් හි පැවැත්වුණු ඉන්දියානු ජාතික සංගමයේ සමුළුවට ගුණවර්ධන යුවල සහභාගි වූ දා පටන් සිද්ධීන් ආවර්ජණය කරමින් කතා කළේය. 1939 ජුනි 30 දින යුගදිවියට පත් පිලිප් හා කුසුමා ගුණවර්ධන යුවලට සිය විවාහයේ පළමුවන සංවත්සරය පැවැත්වීමට නොහැකි වූ බව සිහිපත් කරවමින් පියසේන මහතා මෙසේ පැවසීය.

'විවාහයේ පළමුවන සංවත්සරය යෙදී තිබුණේ 1940 ජුනි 30 දාටය. එහෙත් ඊට දින දොළහකට පෙර යටත්විජිතවාදී මර්ධනය බොරළුගොඩ නිවෙසට කඩා පැන්නේය. ඉංග්‍රීසි රජුට විරුද්ධවීමේ චෝදනාවට පිලිප් ගුණවර්ධන අත්අඩංගුවට ගන්නා ලදි. ඔහු සමඟම ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා හා එඩ්මන් සමරක්කොඩි යන නායකයන්ද බන්ධනාගාරගත කරනු ලැබිණ.



*ඇස් පියසේන මහතා ආරාධිත දේශණය පැවැත්වූ අයුරු*

1936 දෙවන රාජ්‍ය මන්ත්‍රණ සභාවේදී 'මහරජුගේ විපක්ෂය' වූයේ පිලිප් ගුණවර්ධන, ඇන්. ඇම්. පෙරේරා, ඩී. එම්. රාජපක්ෂ යන මන්ත්‍රීන් තිදෙනා බවද පියසේන මහතා සිහිපත් කර දුන්නේය.



*පුෂ්පෝපහාර දැක්වීමට නැගීසිටි ආරාධිතයෝ.*
*දකුණේ සිට ඇමැති දිනේෂ් ගුණවර්ධන, ජනාධිති මහින්ද රාජපක්ෂ, සෑම් විජේසිංහ සහ ගීතාංජන ගුණවර්ධන.*

මේ අවස්ථාවට 1959 පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ව සිටි එම්.පී. හේරත් (දැදිගම), එම්.එස්. තේමිස්(මැද කොළඹ), යන මන්ත්‍රීවරුන්ද සහභාගි වූ අතර දැනට වසර 100ක් සපුරා සිටින දයා පැස්කුවල්(මතුගම), සහ 94 වියේ පසුවන එස්.ඩී. බණ්ඩාරනායක (ගම්පහ) යන මහතුන් දෙපොළගේද සංදේශ එවා තිබුණි.

බණ්ඩාරනායක මහතාගේ සංදේශය ඉදිරිපත් කරන ලද්දේ ඔහුගේ පුත් පණ්ඩු බණ්ඩාරනායක ඇමැතිවරයා විසිනි.

පිළිගැනීමේ කතාව කරන ලද්දේ අමාත්‍ය ගීතාංජන ගුණවර්ධන මහතා විසිනි. උත්සවයේ මූලාසනය දරන ලද්දේ පාර්ලිමේන්තුවේ හිටපු මහ ලේකම් සෑම් විජේසිංහ මහතාය.

ශ්‍රීලාල් සෙනෙවිරත්න


## සියලුම ජෝතිශ්‍ය කටයුතු

දෙස් විදෙස් කේන්ද්‍ර සෑදීම, පලාපල ලියා දීම,
කරදර ගැටළු වලට පිළියම්, අපල වලට පිළියම් හා වාර්තා......
විවාහ සීහුම්, පොරොන්දම් ගැලපීම, දෝෂ විමසීම හා මඟහරවා ගැනීමට උපදෙස්.....
මංගල, මල්වර, නිවාස, විභාග, අකුරු කරවීමේ ශුභ නැකත්.......
නමට අකුරු, නම් තැබීම....
දල, සිරිපති, ක්‍රිෂ්ණමූර්ති හෝ ඕනෑම ක්‍රමයකට කර දෙන්නෙමු.

*ඊ මේල්, දුරකතන මගින් විශේෂ කඩිනම් සේවා.......*

රහස්‍යභාවය සුරකිමු

**සුබෝධා ජෝතිශ්‍ය සේවය**

www.subodha-inc.com.au
0420682644/ 0433536097
subodha.inc@email.com



EASE YOUR TAX BURDEN, ENHANCE YOUR WEALTH

SANDAL
TAX ADVISORS PTY LTD

- TAX RETURNS
- ACCOUNTING AND BOOKKEEPING
- TAX PLANNING
- BAS AND IAS
- BUSINESS AND COMPANY REGISTRATION
- SELF-MANAGED SUPER FUND ACCOUNTING
- SET UP COMPANY, TRUST & SMSF
- FBT, WORK COVER, PAYROLL TAX, SUPERANNUATION
- BUSINESS CONSULTING

Amal Ramyanath
CPA, ACA, MBA & B.Sc
Registered Tax agent

SANDAL
SANDAL BUSINESS SOLUTIONS PTY LTD

GUSS DESIGN 9769 0099

- BUSINESS SERVICES
- PROJECT REPORTS
- BUDGET & CASH FLOW PREPARATION
- BODY CORPORATE ACCOUNTING
- FINANCIAL & MANAGEMENT REPORT
- BUSINESS PROCESS MANAGEMENT
- PROJECT EVALUATION & MANAGEMENT
- SET UP ACCOUNTING SOFTWARE
- FINANCIAL & MANAGEMENT REPORT
- BUSINESS RESTRUCTURING
- LABOUR HIRING

Namal Gomes
B.Sc. (Acct), MBA (Sri. J), ACA, ASCMA
sandalsolutions@gmail.com

PROFESSIONAL, FRIENDLY & PERSONALIZED SERVICE

66 Princess Highway
Dandenong VIC 3175

Tel 8707 5542
Mob 0451 698 725

Branch - 31 Madeline St Glen Waverley VIC 3150
Tel 8802 8818 Mob 0412 775 889 Email sandalmanagement@optusnet.com.au